
කක්කොටු
මඩිත්ත
පිනේන්ද්‍රා විමාශි මාරසිංහ

# කක්කොටු මඩිත්ත

பினேன்ද්‍රා விமாஷி மாரஸிංஹ

කතුවරියගේ තෙවන කෘතිය

**කක්කොටු මඩිත්ත**

**ජිනේන්ද්‍රා විමාශි මාරසිංහ**

ISBN NO: 978-624-206-826-8

ප්‍රථම මුද්‍රණය - 2023.12.04

කතුවරියගේ වෙනත් කෘති

සුදු පරෙවියා

මී පවුල සහ යාළු ගෙම්බා

කවර නිර්මාණය - ජිනේන්ද්‍රා විමාශි මාරසිංහ

කතෘ ප්‍රකාශනයකි

# පිදුම

ශිෂ්‍යත්ව විභාගය නිසා හිත හොඳටෝම

නොසන්සුන් වී තිබුණත්,

එය අවසන් වූ විගස, ටිකක් ගිමන් හැරලා,

සතුටින් ඉන්නා විට හිතුනා

අම්මා හැම වේලාවෙම කියන

**E-Book** එක ලියන්න.

කොළයකුයි, පැන්සලකුයි රැගෙන ලියුවා,

මා ගිය චාරිකාවක විස්තර

කතන්දරයකට ගොනු කර,

ඇන්දා ලස්සන චිත්‍ර කිහිපයකුත්

දුන්නා අමිතා කුමාරි ගුරු මෑණියන්ට

කරන්නට, දොස් නිදොස්

කියවා බලා අවසානය තෙක්

සකසා දුන් මේ පොත

සෙනෙහසින් පුදමි

මගේ මව් පිය දෙපළට සහ

**5-A** ශ්‍රේණියේ

දයාබර අමිතා කුමාරි ගුරු මවුට.

## පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුලින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 . 11 . 01

පබෝදි, සමාධි, පාරමී, තරුෂ සහ දිමුතු හොඳ යහළුවෝ පස් දෙනෙක්. එම යහළුවන් හැමදාම පාසල අවසන් වී ගෙදර යන විට ගම මැදින් ගලා යන ඇළ ළඟට පැමිණ ටිකක් වෙලා ගිමන් හරිනවා. ඉන් පසු ගෙදර ගොස් ආපසු එතැනට එකතු වී සෙල්ලම් කරනවා.

එක දවසක් "හෙට අපි මොන සෙල්ලම ද කරන්නේ කියා" සමාධි ඇසුවා. හෙට අපි අලුත් දෙයක් කරමු ද? අපි සියලු දෙනාම හෙට කක්කොටු මඩිත්ත නැරඹීමට යමු ද? යි කියා පාරමී කිව්වා.

"කක්කොටු මඩිත්ත", ඒ මොකක් ද ඒ" තරුෂ ඇහුවා "මොකක් ද කියලා, හෙට අපි ගිහිල්ලම බලමු කෝ" යැයි පාරමී කිව්වා. "හා එහෙනම් අපි ගිහිල්ලා බලමුකෝ කක්කොටු මඩිත්ත කියන්නේ මොකක් ද ? කියලා" තරුෂ කීවා. "හැබැයි ඒ ගමන ටිකක්

දුෂ්කරයි. කඳු හා පල්ලම් සහිත ස්ථාන ගොඩක් තිබෙනවා" කියා පාරමී කීව්වා. එහෙනම් අපිට මේ ගමන යන්න ටිකක් අපහසු වෙයි" කියා දිමුතු කිව්වා. මගේ තාත්තාට හෙට නිවාඩු, අපි තාත්තාත් එක්ක යමු ද? තරුෂ ඇහුවා. ආ ඒක නම් හොඳ අදහසක්, අපේ ආරක්ෂාවටත් හොඳයිනේ කියලා හැමෝම කිව්වා. එහෙනම් මම අපේ තාත්තාටත් කියලා එක්කරගෙන එන්නම්.

එහෙනම් අපේ චාරිකාවට ආහාර පානත් රැගෙන යන්න වෙයි සමාධි කීව්වා. "හා මම ලොකු වතුර බෝතලයකුයි පැෂන් බීම බෝතලයකුයි ගේන්නම්" කියා දිමුතු කිව්වා. "මම පාන් සහ පොල් සම්බලයක් හදාගෙන එන්නම්" පාරමී කියූ අතර, තරුෂ චොක්ලට් බිස්කට් ගේන්නත්, පබෝදි කප් කේක් ගේන්නත් පොරොන්දු වුණා. ඒ වගේ ම තම තමන්ට අවශ්‍ය තොප්පි, කුඩ, වැහි කබා ආදියත් රැගෙන එන ලෙස සියල්ලෝ ම කථිකා කර ගත්තා. මේ අතරේ පබෝදි

“මම තවත් යෝජනාවක් කරන්න දැ යි” ඇසුවා. ඒ මොකක් ද ඒ, හැමෝ ම නො ඉවසිල්ලෙන්, මම කියන්නේ මේ ගමනට අපිත් එක්ක ලොකු අම්මාත් ගියොත් හොඳයි කියලා. ලොකු අම්මා ඉස්සර කක්කොටු මඩිත්තට ගිහිල්ලා තියෙනවා කියලා දවසක් අපිත් එක්ක විස්තර කීව්වා” හා, ඒ අදහස ගොඩාක් හොඳයි. හැමෝ ම ඒ අදහසට එක හෙලා එකඟ වුණා. දැන් අඳුර වැටී ගෙනත් එනවා, අපි නිවෙස්වලට යමු. හෙට උදේ 8.00 ට ඇළ අසලට එකතු වෙමු යි දිමුතු කිව්වා.

අම්මා සහ තාත්තාගෙන් අවසර අරගෙන, හරියට ම උදෑසන 8.00ට දිමුතු ඇළ ළඟට දුවගෙන ආවා. දිමුතු හූ හඬක් දී ඔහු පැමිණි බව හැමෝට ම ඇගෙව්වා. ඉන් පසු තරුෂත්, තාත්තා සමඟ එතැනට ආවා. සමාධි, පාරමී, පබෝදි හා ලොකු අම්මාත් එතැනට ආවා.

“මට ඊයේ රෑ හීනෙනුත් පෙනුනා අපි ඔක්කොම කක්කොටු මඩිත්තට යනවා, කක්කොට්ටෝ ගොඩාක් එතැන හිටියා” දිමුතු කිව්වා. හැමෝම මර හඩින් සිනාසුනා. “ඇත්තට ම මොකක් ද ඒ කක්කොටු මඩිත්ත කියන්නේ” තරුෂ ආයෙත් ඇසුවා, හරි හරි අද දවස ඇතුළත ඔයාට ඒක දැනගන්න පුළුවන් වෙයි, ලොකු අම්මා කිව්වා. එහෙනම් හා හා පුරා කියා ගමන ආරම්භ කරමු, තුන් සරණේ කවියකින් ගමන ආරම්භ කරමු නේ ද? කියා තාත්තා කියද් දී, සියලු දෙනා ම කොක් හඬළමින් සිනාසුනා.

හැමෝ ම සතුටින් සෙමින් සෙමින් ගමන ආරම්භ කළා. බොරළු පාරේ ටික දුරක් යන විට පාරමීට මහන්සි යි කියා අසළ තිබුණු ගසක් යට වාඩි වුණා. එය දුටු අනෙක් සියලු දෙනාත් එතැනට දිව ගියා.

“හා හා ගමන තව එහෙම්මම යි, පටන් ගත්තා විතරයි, ඔහොම තැන තැන නැවතුනොත් නම් අද, රෑ

වෙනකන් යන්න වෙයි. එන්න, එන්න තව ටිකක් ගිහින් ගිමන් හරිමු" යි තාත්තා කිව්වා.

සියල්ලෝ ම එතැනින් නැගිට නැවතත් ගමන ආරම්භ කළා. තවත් ටිකක් ඉදිරියට යන විට කන්දක් දිස් වුණා. ලොකු අම්මා හොඳ ශක්තිමත් කෝටුවක් කඩාගෙන එය හැරමිටියකට



තබාගෙන කන්ද නගින්න පටන් ගත්තා. සමාධි පාරමිගේ උරහිසේ එල්ලීගෙන කන්ද නගියි. පබෝදි තාත්තාගේ අතේ එල්ලීගෙන, එකිනෙකා පසු පස කන්ද නගියි. ටිකෙන් ටික වට පිටාව අඳුර වැටී කැලෑව පටන් ගත්තා.

“කවුරුවත් තනියම යන්න එපා, හැමෝ ම එකට යමු යි ලොකු අම්මා කිව්වා. මෙන්න දැන්වීමක්, ඒ මොකක් ද ලියලා තියෙන්නේ, “අනවසරයෙන් ඇතුළුවීම තහනම්” අවසර ගන්න කවුරුත් නැනේ, අපි යමු නේ ද?



මහා රූස්ස ගස් අතරින් කුඩා අඩි පාරක් දිස් වුණා. පාරට වැටී ඇති වියළි කොළ උඩ ගමන් කරන විට සර සර ගානා ශබ්දයක් තාලයකට ඇසුණා. කැලෑව මැද හෙයින් හිරු රශ්මියක් ද නොදැනේ. ගමන ද විඩාබර නොවේ. ටික දුරක් යන විට කු.... ක් කු....ක් යන හයානක හඬක් ඇසුණා. ළඟ ම මොනරෙක් ඇති, ඔය ඇසෙන්නේ මොනරාගේ හඬයි තාත්තා කීවේ ය. හැමෝම නිසොල්මනේ මොනරා බලාගැනීමට ආශාවෙන් ගමන් කළෝ ය. "තාත්තා කිව්වා හරි, අන්න මොනරා" පබෝදි පෙන්නුවා ය. පිල් විදහා නටන ලස්සන මොනරෙක් අපට දැක ගන්නට ලැබුණි. සියලු දෙනා ම මොනරා දිහා ටික වේලාවක් බලා සිට නැවතත් ගමන ආරම්භ කළා.

"අන්න නියම ඔංචිල්ලාවක්" තරුෂ එතැනට දිව ගියා. "ඒ පුස් වැලක්" ලොකු අම්මා කිව්වා. මටත් ඔංචිල්ලාව පදින්න ආසයි පාරමියි, සමාධියි දෙදෙනාම එකට ඔංචිල්ලාව පැද්දා. ඒ අසළ ම තිබූ අඹ ගසක දඬු

ලේනෙක් අඹ කනවා. අත්තෙන් අත්තට පැන පැන යන රිලව් රංචුවක් කෑ ගසමින් වැල ගෙඩියකට පොර බදනවා. ඒ අසළ ම විශාල ගලක් තිබුණා. හැමෝ ම එතැන වාඩි වුණා. හැමෝම රැගෙන ආ පාන් කා පැෂන් බීම බිව්වා. "පාරමීගේ පොල් සම්බල් නම් හරිම රසයි" හැමෝම කිව්වා. "අනේ එයාගේ පොල් සම්බල් ඕවා අම්මා හැදුවේ" සමාධි කිව්වා. හරි හරි ඔය දෙන්නා රණ්ඩු වෙන්න එපා, අපි දැන් ඉක්මන් කරලා යමු. හැමෝ ම සතුටින්. දිමුතු සහ තරුෂ දෙදෙනා එකතු වෙලා සිංදුවක් කියන්න පටන් ගත්තා. පාරමී, සමාධි සහ පබෝදිත් එයට එකතු වුණා. කැලෑව මැද හරිම නිස්කලංක යි. සිංදුව ලස්සනට ඇහෙනවා.

දැන් ආයෙත් ගමන පටන් ගත්තා. අර තමා සිවුරු හොරා ඔයාලා දැකලා නෑ නේ ද? තරුෂගේ තාත්තා ලස්සන කහ පාට කුරුල්ලෙක් පෙන්නලා කිව්වා. "එතකොට මාමේ සුදු රෙදි හොරා කියන කුරුල්ලත්

මේ වගේ ද?" පබෝදි ඇසුවා. ඔව් සුදු රෙදි හොරා මේ වගේ ම සුදු පාට පෙන්ද දිග ලස්සන කුරුල්ලෙක් තාත්තා කිව්වා. ඉස්සරහට අපිට තවත් ගොඩාක් කුරුල්ලෝ දැක බලා ගන්න පුළුවන් වෙයි තාත්තා කිව්වා.

"එහෙනම් තව ගොඩාක් දුර යන්න ඇති", සමාධි තනියම සිතුවා. "මම කවදාවත් මේ වගේ කැලෑ පාරක ගිහිල්ලා නෑ" තරුෂ ලොකු අම්මාට කිව්වා. "ඒක තමා අපේ ගම ඇතුළේ අපි නොදන්න ගොඩාක් ලස්සන තැන් තියෙනවා", මේ ගමන කෙළවර වෙන්නේ මාඹය අසලින්, ලොකු අම්මා තරුෂට කිව්වා.

ඇඹුල් පේර හා ජැම් පේර ගස්වල රතුපාටට පිරිලා. අපි ඒවා කඩාගෙන කෑවා.

දැන් ඉස්සරහට අපිට වෙන්නේ පල්ලමක් තරණය කරන්න. හැමෝම සූදානම් වෙන්න කවුරුත් වැටෙන්න එපා. පරෙස්සමෙන් බහින්න තාත්තාත්, ලොකු අම්මාත් කිව්වා. හැමෝම එකිනෙකා පසු පස හෙමින් හෙමින් ගල් පොත්ත දිගේ පහළට බැස්සා.

“ආ.... අර මොකක් ද අර, ලොකු විලක් නේ ද?” තරුෂ කෑ ගැසුවා. “ඔන්න ළමයිනේ අපි ඔක්කොම කක්කොටු මඩිත්තට ආවා”. මේක තමයි කක්කොටු මඩිත්ත කියන්නේ, ඔයාලා අහලා නැද්ද ? ළිඳට කියන තවත් නමක් තමයි “මඩිත්ත” කියන්නේ. ඒ කාලේ කක්කොට්ටෝ ගොඩාක් මේ ළිඳ වටේ හිටියා, ඒකයි කක්කොටු මඩිත්ත කියලා කියන්නේ. අපි පොඩි කාලේ මේ කක්කොටු මඩිත්තෙන් තමයි දිය නෑවේ. අපේ අම්මා අපි පොඩි කාලේ එක්කෙනෙක් නාවලා මේ ගල්පොත්තේ ඉන්දවනවා.



ඊළඟට අනෙක් කෙනා නාවනවා. ඒ කාලේ අපි කක්කොටු මඩිත්තට නාන්න එන්න හරිම ආසයි" තාත්තාගේ කතාව හැමෝ ම සතුටින් අහගෙන සිටියා. "ඒකෙනේ මං දැකපු හීනේ හරියට ම හරි නේ" දිමුතු කීවා. හැමෝ ම සිනාසුනා.

"මේ ළිඳේ වතුර හරිම සීතලයි. නාන්න ඕන අය නාන්න", ලොකු අම්මා කිව්වා. අසල කණුවක එල්ලා තිබූ බාල්දිය අරගෙන හරිම සතුටින් එක එක්කෙනා නාන්න පටන් ගත්තා.

දිය නෑමෙන් පසු හැමෝ ම අසල තිබූ ගල් පොත්තේ වාඩිවී තරුෂ හා පබෝදි ගෙනාව චොක්ලට් බිස්කට් හා කප් කේක් කෑවා.

එහෙම නම් දැන් අපේ "කක්කොටු මඩිත්ත" චාරිකාව අවසන් කරමු නේ ද?" තාත්තා කිව්වා. "දැන්

අපි ආව පාරේම ද ආපසු යන්නේ" දිමුතු ඇසුවා. "නෑ අපි දැන් මෙතනින් පහළට බැහැලා ප්‍රධාන පාරට යමු. මේ පාර ගොඩාක් ළඟයි" තාත්තා කිව්වා. හැමෝ ම සෙමින් සෙමින් කැලෑව මැද්දෙන් පහළට බැහැලා ප්‍රධාන පාරට ළඟා වුණා. එතැනින් බස් රථයකට ගොඩ වී සියල්ලෝ ම සතුටින් නිවෙස් බලා පිටත් වුණා.

නිමි.



## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01

ISBN NO: 978-624-206-826-8